(නවවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 89.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2021 අගෝස්තු 05 බ්‍රහස්පතින්දා පූ.භා. 10.00 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

72/2020

ගරු හේෂා විතානගේ මහතා,— රාජ්‍ය සේවා පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2010 වර්ෂයේ සිට මේ දක්වා ඝන අපද්‍රව්‍ය කළමනාකරණය හා සම්බන්ධ ජාත්‍යන්තර පුහුණු වැඩසටහන්වලට සහභාගී වූ පළාත් පාලන නියෝජිතයන් සංඛ්‍යාව, එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම එක් එක් නියෝජිතයාගේ නම හා අදාළ පළාත් පාලන ආයතනයේ නම වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම එක් එක් වැඩමුළුව පැවති රට, නගරය හා කාලසීමාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම එක් එක් වැඩමුළුවට සහභාගී වීම සඳහා වැය කළ මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) එම වැඩමුළුවලින් පසුව ඝන අපද්‍රව්‍ය කළමනාකරණය හා සම්බන්ධ වැඩසටහන් ක්‍රියාත්මක කළ පළාත් පාලන ආයතනවල නම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

244/2020

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2015 සිට 2019 දක්වා එක් එක් වර්ෂය තුළ —

(i) ශ්‍රී ලංකාවට ආනයනය කළ වෛද්‍ය තාක්ෂණික උපකරණ ප්‍රමාණය කොපමණද;

(ii) ඒ සඳහා වැය වූ මුදල කොපමණද;

(iii) එම වෛද්‍ය තාක්ෂණික උපකරණ ආනයනය කළ රටවල් කවරේද;

(iv) එම වෛද්‍ය තාක්ෂණික උපකරණ ආනයනය කළ සමාගම්වල නම් කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම කාලසීමාව තුළ ශ්‍රී ලංකාවට වෛද්‍ය තාක්ෂණික උපකරණ ආනයනය කිරීම සඳහා වැය වූ මුළු මුදල කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

260/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— තරුණ හා ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ වත්මන් සාමාජික/සාමාජිකාවන්ගේ නම් හා ඔවුන්ගේ සුදුසුකම් වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) පසුගිය කාලයේදී සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණයේ පරිපාලන කටයුතුවල බිඳවැටීමක් සිදුව තිබූ බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) එසේ නම්, සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණයේ පරිපාලන කටයුතු විධිමත් කිරීම සඳහා අමාත්‍යාංශය විසින් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

323/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවට ආවේණික ඒකදේශික ප්ලවාංග හා එවැනි ශාක විශේෂ සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ අතරින් වඳවී යාමේ තර්ජනයට ලක්වීමෙන් රතු දත්ත පොතට ඇතුළත් කර ඇති ප්ලවාංග හා එවැනි ශාක විශේෂ කවරේද;

(iii) මේ වනවිට වඳවී ගොස් ඇති ඒකදේශික ප්ලවාංග හා එවැනි ශාක විශේෂ කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඒකදේශික ප්ලවාංග හා එවැනි ශාක විශේෂ පිළිබඳ මෑතකදී සමීක්ෂණයක් සිදුකර තිබේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

(iii) නොඑසේ නම්, එවැනි සමීක්ෂණයක් සිදු කරන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඒකදේශික ප්ලවාංග හා එවැනි ශාක විශේෂ ආරක්ෂා කිරීමට ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(ii) එසේ නම්, එම ක්‍රියාමාර්ග කවරේද;

(iii) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්න තවදුරටත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

619/2020

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට කලා විෂය ධාරාවෙන් බාහිර උපාධි පාඨමාලා සඳහා නිර්දේශිත විෂයයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම විෂයන්වල නම් කවරේද;

(iii) එම විෂය ධාරාවන් යම් සමාලෝචනයකට ලක්කර තිබේද;

(iv) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) වර්තමාන රැකියා වෙළඳපොළට සහ ගෝලීය ප්‍රවණතාවලට අනුගත විය හැකි බාහිර උපාධිධාරියෙකු බිහි කිරීමට ගනු ලබන පියවර කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

818/2020

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශනය අනුව දේශීය කර්මාන්ත දිරිගැන්වීම රජයේ අරමුණ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) 2020 වර්ෂයේදී ආරම්භ කරන ලද නව කර්මාන්ත කවරේද;

(ii) 2021 වර්ෂයේදී ආරම්භ කිරීමට සැලසුම් කර ඇති නව කර්මාන්ත සහ එම කර්මාන්ත ආරම්භ කරනු ලබන ප්‍රදේශ කවරේද;

(iii) එම කර්මාන්ත ආරම්භ කිරීම සඳහා දේශීය සහ විදේශීය ආයෝජකයන් ඉදිරිපත් වී තිබේද;

(iv) එසේ නම්, එම ආයෝජකයන් දිරිගැන්වීමට පියවර ගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

834/2020

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— විදුලිබල අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සූර්ය විදුලිබලය, සුළං විදුලිබලය සහ කුඩා ජල විදුලි බලාගාරවලින් විදුලිය මිලදී ගැනීමේදී ලංකා විදුලිබල මණ්ඩලය විසින් අනුගමනය කරනු ලබන ක්‍රමවේදය, එක් එක් මිලදී ගැනීම් වර්ගය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) ස්ථාවර මිලට විදුලිය මිලදී ගැනීම් සිදු කරන ලද වකවානුවේදී, ඉහත සඳහන් විදුලිය මිලදී ගැනීම්වලදී ඒකකයක් සඳහා අවසන්වරට ගෙවන ලද මිල, එක් එක් මිලදී ගැනීම් වර්ගය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත (ii) හි සඳහන් මිල, තීරණය කරන ලද දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

851/2020

ගරු කිංස් නෙල්සන් මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පොළොන්නරුව දිස්ත්‍රික්කයේ පිහිටා ඇති ප්‍රධාන වැව් බොහොමයක සැල්වීනියා නැමැති පාසි වර්ගය වැවී ඇති බවත්;

(ii) ඉහත වැව් අතරින් ගිරිතලේ ගොවි ජනපද ව්‍යාපාරයට අයත් වන තඹල වැව හා කඩවල වැව යන වැව්වල මෙම පාසි වර්ගය විශාල වශයෙන් වැවී ඇති බවත්;

(iii) එම වැව්වල පාසි වැවී තිබීම හේතුවෙන් ඒවාගේ රඳවාගත හැකි ජල ධාරිතාවය අවම වී ඇති අතර එම වැව්වලින් කෘෂි කර්මාන්තයට සපයනු ලබන ජල ප්‍රමාණයද අවම වී ඇති බවත්;

(iv) කඩවල වැව වැසි කාලයේදී වාන් දමන අතර එම වාන් ජලය සමඟ පාසි බීජ ගලාවිත් එම වැවට පහළින් පිහිටා ඇති පරාක්‍රම සමුද්‍රයට පාසි බෝවීමේ අවදානමක් පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එසේ නම්, තඹල වැව හා කඩවල වැව යන වැව්වල මේ වනවිට වැවී ඇති පාසි ඉවත් කිරීමට පියවර ගන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

931/2020

ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතා,— කම්කරු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) විදේශගත ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් ශ්‍රී ලංකාවට නැවත රැගෙන ඒම සඳහා ගුවන්යානා පහසුකම් සැපයීමට අවසර ලබා දී ඇති සමාගම්වල නම් කවරේද;

(ii) එම සමාගම් තෝරා ගත් ක්‍රමවේදය කවරේද;

(iii) විදේශගත ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් ශ්‍රී ලංකාවට නැවත රැගෙන ඒමේදී ඉහත සමාගම් විසින් අසාධාරණ ලෙස ගාස්තු අයකරන බව දන්නේද;

(iv) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවට නැවත පැමිණෙන විදේශගත ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් නිරෝධායනය කරවීම සඳහා අනුමතිය ලබා දී ඇති පෞද්ගලික සමාගම්වල නම් කවරේද;

(ii) එම සමාගම් තෝරා ගත් ක්‍රමවේදය කවරේද;

(iii) ශ්‍රී ලංකාවට නැවත පැමිණි විදේශගත ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් නිරෝධායනය කරවීමේදී ඉහත සමාගම් විසින් අසාධාරණ ලෙස ගාස්තු අයකරන බව දන්නේද;

(iv) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

974/2020

ගරු එස්.එම්.එම්. මුෂාරෆ් මහතා,— ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) පොතුවිල් ප්‍රාදේශීය සභාව විසින් සිය බලප්‍රදේශයේ පිහිටි නිවාස සඳහා අක්‍රමවත් ලෙස ජල සැපයුම් ලබා දෙනු ලබන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) පොතුවිල් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටා ඇති, ජලය සහ මලාපවහන පහසුකම් නොමැති නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) එම නිවාස සඳහා ජලය සහ මලාපවහන පහසුකම් ලබා දීමට වැඩපිළිවෙළක් තිබේද;

(iii) එසේ නම්, ඒ සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන වැඩකටයුතු ආරම්භයේ දී

## පනත් කෙටුම්පත් පිළිගැන්වීම පිළිබඳ දැනුම්දීම

1.

බලශක්ති අමාත්‍යතුමා,— ඛනිජතෙල් සම්පත්,— ශ්‍රී ලංකා ඛනිජතෙල් සංවර්ධන අධිකාරිය පිහිටුවීම සඳහා ද; උද්ගාමී ඛනිජතෙල් කර්මාන්තය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම සහ ශ්‍රී ලංකාවේ නවීන ගවේෂණ, සංවර්ධන, නිෂ්පාදන සහ කළමනාකරණ පරිචයන් තුළින් දේශීය ඛනිජතෙල් සම්පත්වල උපරිම ආර්ථික වටිනාකම ලබාගැනීම සඳහා නියාමන සහ කළමනාකරණ ව්‍යුහයක් සකස් කිරීම සඳහා ද; 2003 අංක 26 දරන ඛනිජතෙල් සම්පත් පනත ඉවත් කිරීම සඳහා ද; ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනත් කෙටුම්පතකි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

## යෝජනා පිළිබඳ දැනුම්දීම

2.

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

" සාමය, අධ්‍යාපනය, බලගැන්වීම සහ සංවර්ධනය උදෙසා වූ ක්‍රීඩා ආයතනය (SPEED) සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*2.

අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා,— ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ නියමය (අංක 1),— 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3(4) වගන්තිය යටතේ වෙල්කම්හොටෙල්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 මැයි 24 දිනැති අංක 2229/2 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.07.06 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*3.

අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා,— ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ නියමය (අංක 2),— 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3(4) වගන්තිය යටතේ ඇවික් ඉන්ටර්නැෂනල් හොටෙල්ස් ලංකා ලිමිටඩ් සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 මැයි 24 දිනැති අංක 2229/3 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.07.06 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*4.

අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා,— ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ නියමය (අංක 3),— 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3(4) වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 අප්‍රේල් 19 දිනැති අංක 2224/2 දරන අති විශේෂ ගැසට් පත්‍රය සහ එම ගැසට් පත්‍රය සංශෝධනය කරමින් 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3(4) වගන්තිය යටතේ 2021 ජූලි 06 දිනැති අංක 2235/15 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.07.19 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*5.

සෞඛ්‍ය අමාත්‍යතුමිය,— පරිපූරක මුදල — ශීර්ෂය 441 — වැඩසටහන 01 සහ 02,— † 2021 ජනවාරි 01 දිනෙන් ආරම්භ වන හා 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන මුදල් වර්ෂයේ ප්‍රයෝජනය සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලෙන් හෝ රජයට අයත් අනිකුත් ඕනෑම අරමුදලකින් හෝ මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අභිමතය පරිදි රජය විසින් ලබාගන්නා ලද ඕනෑම ණය මුදලකින් රුපියල් මිලියන එකොළොස් දහස් අටසිය හතළිස් තුනයි දශම හතයි (රු. 11,843,700,000) නොඉක්මවන අතිරේක මුදලක් ගෙවිය යුතු බවටත්, එකී මුදල මෙහි ඇති උපලේඛනයේ දක්වා ඇති පරිදි වියදම් කළයුතු බවටත්, මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:—

**උපලේඛනය**

**ශීර්ෂය 441 - ප්‍රාථමික සෞඛ්‍ය සේවා, වසංගත රෝග හා කොවිඩ් රෝග පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යවරයා**

**වැඩසටහන 01 - මෙහෙයුම් වැඩසටහන**

| | |
|---|---|
| පුනරාවර්තන වියදම් | රු. 115,700,000 |
| මූලධන වියදම් | රු. 19,000,000 |

**වැඩසටහන 02 - සංවර්ධන වැඩසටහන**

| | |
|---|---|
| පුනරාවර්තන වියදම් | රු. 11,455,000,000 |
| මූලධන වියදම් | රු. 254,000,000 |
| පුනරාවර්තන වියදම් | රු. 11,570,700,000 |
| මූලධන වියදම් | රු. 273,000,000 |
| **මුළු වියදම** | **රු. 11,843,700,000** |

(රුපියල් මිලියන එකොළොස් දහස් අටසිය හතලිස් තුනයි දශම හතයි.)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

† 2021 ජූලි 19 දින ඉදිරිපත් කරන ලද 2021 අංක 2 දරන පරිපූරක ඇස්තමේන්තුව බලන්න. පරිපූරක ඇස්තමේන්තු අංක 1 එකතුව රු. 200,000,000,000.

*6.

ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ජාතික ආරක්ෂක විශ්වවිද්‍යාලය පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය. (2021 ජූලි 08) [1]

*7.

ආගාමික හා විගාමික පනත යටතේ නියෝග,— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2021 ජූලි 08),— "2019 ජුනි 03 දිනැති අංක 2126/13 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ ආගාමික හා විගාමික නියෝග පරිච්ඡින්න කිරීම සඳහා (351 අධිකාරිය වූ) ආගාමික හා විගාමික පනතේ 23 වගන්තිය සමඟ කියවිය යුතු 52 වගන්තිය යටතේ ආරක්ෂක අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021.06.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය." යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

*8.

මුදල් අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි,— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 මැයි 06 දිනැති අංක 2226/48 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.06.23 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*9.

කර්මාන්ත අමාත්‍යතුමා,— ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය පනත යටතේ නියෝග,— 1993 අංක 50 දරන ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය පනතේ 14(1)(ඊ) සහ 15 වගන්ති සමඟ කියවිය යුතු 53 වගන්තිය යටතේ මැණික් සහ ස්වර්ණාභරණ බලපත්‍ර ගාස්තු සම්බන්ධයෙන් කර්මාන්ත සහ සැපයුම් කළමණාකරණ අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2020 මාර්තු 02 දිනැති අංක 2165/1 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ සහ එම ගැසට් පත්‍රයේ මුද්‍රණ දෝෂ නිවැරදි කරමින් 1993 අංක 50 දරන ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය පනතේ 53 වගන්තිය යටතේ කර්මාන්ත අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2021 අප්‍රේල් 01 දිනැති අංක 2221/49 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.06.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*10.

මුදල් අමාත්‍යතුමා,— එකතු කළ අගය මත බදු පනත යටතේ නියෝග,— 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 75 වගන්තිය යටතේ එකතු කළ අගය මත බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 මැයි 20 දිනැති අංක 2228/33 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.07.20 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*11.

2019 කොරෝනා වෛරස් රෝගය (කොවිඩ් - 19) (තාවකාලික විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*12.

මුදල් පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*13.

ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*14.

අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා,— 2015 ජනවාරි මස 08 වැනි දින සිට 2019 නොවැම්බර් මස 16 වන දිනෙන් අවසන් වූ කාල සීමාව තුළ නිලතල දැරූ රජයේ නිලධරයන්, රාජ්‍ය සංස්ථාවල සේවකයින්, සන්නද්ධ හමුදාවන් හි සහ පොලිස් සේවයෙහි සාමාජිකයින්ට සිදු වී ඇතැයි කියන දේශපාලන පළිගැනීම් පිළිබඳ පරීක්ෂා කර තොරතුරු ලබා ගැනීම සඳහා වන ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ තීරණ සහ නිර්දේශ ක්‍රියාත්මක කිරීම,—

උක්ත කරුණ සම්බන්ධයෙන් අතිගරු ජනාධිපතිතුමා විසින් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද 2021.01.15 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයට අදාළ අමප/21/0105/301/003 හා 2021.02.15 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලබා දී ඇත:—

(අ) ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ අවසන් වාර්තාව (එහි පළමුවැනි, දෙවැනි සහ තෙවැනි වෙළුම් ද, යතුරුලියන දෝෂ හා මුද්‍රණ දෝෂ නිවැරදි කිරීමේ පරිශිෂ්ඨය ද ඇතුළත්) යෝජනා සම්මතයක් මඟින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම;

(ආ) එම අවසන් වාර්තාවේ පළමුවැනි වෙළුමේ අයිතම අංක 08 හි සඳහන් දූෂණ විරෝධී කමිටුව සම්බන්ධයෙන් එම කොමිෂන් සභාව විසින් ලබා දී ඇති තීරණ සහ නිර්දේශ ක්‍රියාත්මක කිරීම;

(ඇ) එකී අයිතම අංක 08 හි සඳහන් තීරණ අංක 1 සහ නිර්දේශ අංක 1 ක්‍රියාත්මක කිරීම සඳහා විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවක් පත් කිරීම හෝ පාර්ලිමේන්තුව විසින් ඒ සඳහා නිශ්චය කරනු ලබන වෙනත් සුදුසු යාන්ත්‍රණයක් නිර්මාණය කිරීම;

(ඈ) ඉහත කී ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ අවසන් වාර්තාවේ පළමුවැනි, දෙවැනි හා තෙවැනි වෙළුම්වල සහ එම අවසන් වාර්තාවේ යතුරුලියන දෝෂ හා මුද්‍රණ දෝෂ නිවැරදි කිරීමේ පරිශිෂ්ඨයේ අයිතම අංක 08 හි සහ අයිතම අංක 09 හි I සිට LXI දක්වා පැමිණිලිවලට අදාළව එම කොමිෂන් සභාව විසින් ලබා දී ඇති තීරණ හා නිර්දේශ ක්‍රියාත්මක කිරීම පිණිස එකී තීරණ හා නිර්දේශ, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව, රාජ්‍ය සේවා කොමිෂන් සභාව, පොලිස්පති, අදාළ අමාත්‍යාංශ භාර අමාත්‍යවරුන් සහ අමාත්‍යාංශ ලේකම්වරුන් ඇතුළු අදාළ බලධාරීන් වෙත යොමු කිරීම; සහ

(ඉ) එකී අවසන් වාර්තාවේ තෙවැනි වෙළුමෙ හි අයිතම අංක 10 යටතේ සඳහන් පැමිණිලිවලට අදාළව එකී ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව විසින් ලබා දී ඇති තීරණ හා නිර්දේශ ක්‍රියාත්මක කිරීම.

ඊට අනුකූලව, ඉහත (ඇ) හි සඳහන් පරිදි අංක 2221/54 සහ 2021.04.01 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මඟින් අතිගරු ජනාධිපතිතුමා විසින් විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවක් පත්කර ඇති හෙයින් ඉහත සඳහන් අමාත්‍ය මණ්ඩල තීරණයේ සඳහන් ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ අවසන් වාර්තාවේ ඇතුළත් අයිතම අංක 08 හි තීරණ සහ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව ලැබීමෙන් පසු සලකා බලනු ලැබීමට යටත්ව එකී අමාත්‍ය මණ්ඩල තීරණයෙහි සඳහන් දේශපාලන පළිගැනීම් පිළිබඳ පරීක්ෂා කර තොරතුරු ලබා ගන්නා ලද ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ අවසන් වාර්තාවේ (එහි පළමුවැනි, දෙවැනි සහ තෙවැනි වෙළුම් ද, යතුරුලියන දෝෂ සහ මුද්‍රණ දෝෂ නිවැරදි කිරීමේ පරිශිෂ්ඨය ද ඇතුළත්) අයිතම අංක 08 අත්හැර 09 සහ 10 අයිතමයන් හි ඇතුළත් තීරණ හා නිර්දේශ ඉහත (ඈ) සහ (ඉ) හි සඳහන් පරිදි ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කර සිටියි.

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

**[1]**

"පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය" යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

---

## වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

1.

1900/2021

ගරු අනුර දිසානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව යටතේ පවතින රක්ෂිතවල හෝ කළමනාකරණ ප්‍රදේශවල නම් කවරේද;

(ii) එම එක් එක් රක්ෂිතය හෝ කළමනාකරණ ප්‍රදේශය එසේ රක්ෂිතයක් හෝ කළමනාකරණ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලද එක් එක් ගැසට් නිවේදනයේ අංකය සහ දිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම ගැසට් නිවේදන සභාගත කරන්නේද;

(iv) යම් ප්‍රදේශයක්, රක්ෂිතයක් හෝ කළමනාකරණ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කරමින් නිකුත් කරන ලද ගැසට් නිවේදනයක් අහෝසි කරමින් නිකුත් කරන ලද ගැසට් නිවේදන තිබේද;

(v) එසේ නම්, එම එක් එක් ගැසට් නිවේදනයේ අංකය සහ දිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(vi) එම ගැසට් නිවේදන සභාගත කරන්නේද;

(vii) ඉහත දෙපාර්තමේන්තුව යටතේ ඉදිරියේදී රක්ෂිත හෝ කළමනාකරණ ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කිරීමට සැලසුම්කර ඇති ප්‍රදේශවල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

1901/2021

ගරු අනුර දිසානායක මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මධ්‍යම පරිසර අධිකාරිය යටතේ පවතින රක්ෂිතවල හෝ කළමනාකරණ ප්‍රදේශවල නම් කවරේද;

(ii) එම එක් එක් රක්ෂිතය හෝ කළමනාකරණ ප්‍රදේශය එසේ රක්ෂිතයක් හෝ කළමනාකරණ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලද එක් එක් ගැසට් නිවේදනයේ අංකය සහ දිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම ගැසට් නිවේදන සභාගත කරන්නේද;

(iv) යම් ප්‍රදේශයක්, රක්ෂිතයක් හෝ කළමනාකරණ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කරමින් නිකුත් කරන ලද ගැසට් නිවේදනයක් අහෝසි කරමින් නිකුත් කරන ලද ගැසට් නිවේදන තිබේද;

(v) එසේ නම්, එම එක් එක් ගැසට් නිවේදනයේ අංකය සහ දිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(vi) එම ගැසට් නිවේදන සභාගත කරන්නේද;

(vii) ඉහත අධිකාරිය යටතේ ඉදිරියේදී රක්ෂිත හෝ කළමනාකරණ ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කිරීමට සැලසුම්කර ඇති ප්‍රදේශවල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

1902/2021

ගරු අනුර දිසානායක මහතා,— වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ පවතින රක්ෂිතවල නම් කවරේද;

(ii) එම එක් එක් රක්ෂිතය එසේ රක්ෂිතයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලද එක් එක් ගැසට් නිවේදනයේ අංකය සහ දිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම ගැසට් නිවේදන සභාගත කරන්නේද;

(iv) යම් ප්‍රදේශයක්, රක්ෂිතයක් ලෙස ප්‍රකාශයට පත් කරමින් නිකුත් කරන ලද ගැසට් නිවේදනයක් අහෝසි කරමින් නිකුත් කරන ලද ගැසට් නිවේදන තිබේද;

(v) එසේ නම්, එම එක් එක් ගැසට් නිවේදනයේ අංකය සහ දිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(vi) එම ගැසට් නිවේදන සභාගත කරන්නේද;

(vii) ඉහත දෙපාර්තමේන්තුව යටතේ ඉදිරියේදී රක්ෂිත හෝ කළමනාකරණ ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කිරීමට සැලසුම්කර ඇති ප්‍රදේශවල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

1903/2021

ගරු අනුර දිසානායක මහතා,— වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වනජීවී දෙපාර්තමේන්තුව යටතේ පවතින රක්ෂිතවල නම් කවරේද;

(ii) එම එක් එක් රක්ෂිතය එසේ රක්ෂිතයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලද එක් එක් ගැසට් නිවේදනයේ අංකය සහ දිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම ගැසට් නිවේදන සභාගත කරන්නේද;

(iv) යම් ප්‍රදේශයක්, රක්ෂිතයක් ලෙස ප්‍රකාශයට පත් කරමින් නිකුත් කරන ලද ගැසට් නිවේදනයක් අහෝසි කරමින් නිකුත් කරන ලද ගැසට් නිවේදන තිබේද;

(v) එසේ නම්, එම එක් එක් ගැසට් නිවේදනයේ අංකය සහ දිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(vi) එම ගැසට් නිවේදන සභාගත කරන්නේද;

(vii) ඉහත දෙපාර්තමේන්තුව යටතේ ඉදිරියේදී රක්ෂිත හෝ කළමනාකරණ ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කිරීමට සැලසුම්කර ඇති ප්‍රදේශවල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

1904/2021

ගරු අනුර දිසානායක මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) අම්පාර, මහඔය, පොල්ලෙබැද්ද, ගල්වලයාය රක්ෂිත වනාන්තරයේ සිදු කරනු ලබන මහා පරිමාණ වන විනාශය සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් ගෙන ඇති පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත රක්ෂිත වනාන්තරය එළිපෙහෙළි කිරීමේදී පරිසර පනතට අනුව කටයුතු කරන ලෙස දන්වා තිබේද;

(ii) එසේ නම්, එම ලිපියේ පිටපතක් ලබා දෙන්නේද;

(iii) ඉහත වනාන්තරයේ එළිපෙහෙළි කරන ලද ප්‍රදේශ පරීක්ෂා කර තිබේද;

(iv) එම එළිපෙහෙළි කිරීමේදී පරිසර හානියක් සිදු වී තිබේද;

(v) එසේ නම්, සිදු වී ඇති පරිසර හානියේ ස්වභාවය කවරේද;

(vi) එම පරිසර හානිය සම්බන්ධයෙන් ගෙන ඇති පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

1905/2021

ගරු අනුර දිසානායක මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහඔය මහවැලි නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලය යටතේ ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) ඒ අතරින් මේ වනතෙක් ජනතාවට බෙදා දී නොමැති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) ඊට අදාළ නිල ලේඛනය සභාගත කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මහඔය, පොල්ලේබැද්ද කෘෂි සංවර්ධන ව්‍යාපෘතියට ලබා දී ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එම ඉඩම් ලබා දී ඇති සමාගම්වල නම් කවරේද;

(iii) එම එක් එක් සමාගමට ලබා දී ඇති ඉඩම් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම ඉඩම් අක්කරයක් විකුණන ලද හෝ බදු දෙන ලද මුදල කොපමණද;

(v) එමගින් අයකර ගෙන ඇති මුළු මුදල කොපමණද;

(vi) එම ඉඩම් ලබා දෙන ලද්දේ ගිවිසුම් අනුව නම් එම ගිවිසුම් කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත (ආ) (ii) හි සඳහන් සමාගම් විසින් ක්‍රියාත්මක කරනු ලබන කෘෂි ව්‍යාපෘති කවරේද;

(ii) ඊට අදාළ ව්‍යාපෘති වාර්තා සභාගත කරන්නේද;

(iii) එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී අදාළ ගිවිසුම් කොන්දේසි අනුගමනය කර තිබේද;

(iv) නොඑසේ නම්, ඊට විරුද්ධව ක්‍රියාමාර්ග ගෙන තිබේද;

යන්න තවදුරටත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

1907/2021

ගරු අනුර දිසානායක මහතා,— වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අම්පාර දිස්ත්‍රික්කයේ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සතු ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර්වලින්;

(ii) ඒ අතරින් මහඔය සහ පදියතලාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලට අයත් ඉඩම් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන්;

(iii) මහඔය ගල්වලයාය ප්‍රදේශයේ වනාන්තරය, දෙපාර්තමේන්තුවේ පාලනය යටතේ පැවති කාලය;

(iv) එම දෙපාර්තමේන්තුව විසින් ඉහත වනාන්තරය පාලනය කිරීම අත්හරින ලද දිනය සහ ඊට හේතු;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) දෙපාර්තමේන්තුව විසින් ගල්වලයාය ප්‍රදේශයේ සිදු කර ඇති එක් එක් වන වගා ව්‍යාපෘතිය ආරම්භ කරන ලද වර්ෂය සහ එයට වැය කරන ලද මුදල වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) වගා කරන ලද වනාන්තර මැන මායිම් ගල් යොදා තිබේද;

(iii) එසේ නම්, මායිම් ගල් යෙදූ වර්ෂය සහ එයට වැය කරන ලද මුදල වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ගල්වලයාය ප්‍රදේශයේ වනාන්තර ඉඩම් අතරින් රජයේ රක්ෂිත ලෙස ගැසට් කිරීමට සැලසුම් කර ඇති ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර්වලින්;

(ii) එම ඉඩම් ගැසට් කරනු ලබන දිනය;

(iii) එම ගැසට් කිරීම ප්‍රමාද වීමට හේතු;

කවරේද යන්න තවදුරටත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

2110/2021

ගරු රවුෆ් හකීම් මහතා,— ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) "උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම් සභා වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සහ උතුර හා නැගෙනහිර පළාත්වල ඉඩම් කළමනාකරණ කටයුතු විධිමත් කිරීම" යන මැයෙන් වූ අංක 11/0737/533/015 හා 2011.05.04 දිනැති අමාත්‍ය මණ්ඩල ප්‍රතිපත්තිමය තීරණය ක්‍රියාවට නැංවීමක් ලෙස "උතුරු හා නැගෙනහිර පළාත්වල පශ්චාත් යුද ගැටුම් සමයේ රජයේ ඉඩම්වලට අදාළ ගැටලු විසඳීමේ කඩිනම් වැඩසටහන" යන මැයෙන් ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් අංක 2013/01 හා 2013.01.31 දිනැති චක්‍රලේඛය නිකුත් කරන ලද බව දන්නේද;

(ii) එම චක්‍රලේඛයේ 2.2.2.1, 2.2.3.4, 2.2.3.5 හා 3.5 යන වගන්ති ප්‍රකාරව අම්පාර දිස්ත්‍රික්කයේ එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් කවරේද;

(iii) එම වැඩසටහන්වලදී ලබා දෙන ලද විසඳුම් කවරේද;

(iv) ගැටලු සඳහා විසඳුම් ලබා දෙන ලද එක් එක් පුද්ගලයාගේ නම සහ ලිපිනය එක් එක් ග්‍රාම නිලධාරි වසම අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

2111/2021

ගරු රවුෆ් හකීම් මහතා,— ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) "උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම් සභා වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සහ උතුර හා නැගෙනහිර පළාත්වල ඉඩම් කළමනාකරණ කටයුතු විධිමත් කිරීම" යන මැයෙන් වූ අංක 11/0737/533/015 හා 2011.05.04 දිනැති අමාත්‍ය මණ්ඩල ප්‍රතිපත්තිමය තීරණය ක්‍රියාවට නැංවීමක් ලෙස "උතුරු හා නැගෙනහිර පළාත්වල පශ්චාත් යුද ගැටුම් සමයේ රජයේ ඉඩම්වලට අදාළ ගැටලු විසඳීමේ කඩිනම් වැඩසටහන" යන මැයෙන් ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් අංක 2013/01 හා 2013.01.31 දිනැති චක්‍රලේඛය නිකුත් කරන ලද බව දන්නේද;

(ii) එම චක්‍රලේඛයේ 2.2.2.1, 2.2.3.4, 2.2.3.5 හා 3.5 යන වගන්ති ප්‍රකාරව මන්නාරම දිස්ත්‍රික්කයේ එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් කවරේද;

(iii) එම වැඩසටහන්වලදී ලබා දෙන ලද විසඳුම් කවරේද;

(iv) ගැටලු සඳහා විසඳුම් ලබා දෙන ලද එක් එක් පුද්ගලයාගේ නම සහ ලිපිනය එක් එක් ග්‍රාම නිලධාරී වසම අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

2112/2021

ගරු රවුෆ් හකීම් මහතා,— ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ''උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම් සභා වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සහ උතුර හා නැගෙනහිර පළාත්වල ඉඩම් කළමනාකරණ කටයුතු විධිමත් කිරීම'' යන මැයෙන් වූ අංක 11/0737/533/015 හා 2011.05.04 දිනැති අමාත්‍ය මණ්ඩල ප්‍රතිපත්තිමය තීරණය ක්‍රියාවට නැංවීමක් ලෙස ''උතුරු හා නැගෙනහිර පළාත්වල පශ්චාත් යුධ ගැටුම් සමයේ රජයේ ඉඩම්වලට අදාළ ගැටලු විසඳීමේ කඩිනම් වැඩසටහන'' යන මැයෙන් ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් අංක 2013/01 හා 2013.01.31 දිනැති චක්‍රලේඛය නිකුත් කරන ලද බව දන්නේද;

(ii) එම චක්‍රලේඛයේ 2.2.2.1, 2.2.3.4, 2.2.3.5 හා 3.5 යන වගන්ති ප්‍රකාරව ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් කවරේද;

(iii) එම වැඩසටහන්වලදී ලබා දෙන ලද විසඳුම් කවරේද;

(iv) ගැටලු සඳහා විසඳුම් ලබා දෙන ලද එක් එක් පුද්ගලයාගේ නම සහ ලිපිනය එක් එක් ග්‍රාම නිලධාරී වසම අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

11.

2113/2021

ගරු රවුෆ් හකීම් මහතා,— ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ''උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම් සභා වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සහ උතුර හා නැගෙනහිර පළාත්වල ඉඩම් කළමනාකරණ කටයුතු විධිමත් කිරීම'' යන මැයෙන් වූ අංක 11/0737/533/015 හා 2011.05.04 දිනැති අමාත්‍ය මණ්ඩල ප්‍රතිපත්තිමය තීරණය ක්‍රියාවට නැංවීමක් ලෙස ''උතුරු හා නැගෙනහිර පළාත්වල පශ්චාත් යුද ගැටුම් සමයේ රජයේ ඉඩම්වලට අදාළ ගැටලු විසඳීමේ කඩිනම් වැඩසටහන'' යන මැයෙන් ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් අංක 2013/01 හා 2013.01.31 දිනැති චක්‍රලේඛය නිකුත් කරන ලද බව දන්නේද;

(ii) එම චක්‍රලේඛයේ 2.2.2.1, 2.2.3.4, 2.2.3.5 හා 3.5 යන වගන්ති ප්‍රකාරව මඩකලපුව දිස්ත්‍රික්කයේ එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් කවරේද;

(iii) එම වැඩසටහන්වලදී ලබා දෙන ලද විසඳුම් කවරේද;

(iv) ගැටලු සඳහා විසඳුම් ලබා දෙන ලද එක් එක් පුද්ගලයාගේ නම සහ ලිපිනය එක් එක් ග්‍රාම නිලධාරී වසම අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

12.

2114/2021

ගරු රවුෆ් හකීම් මහතා,— ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) "උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම් සභා වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සහ උතුර හා නැගෙනහිර පළාත්වල ඉඩම් කළමනාකරණ කටයුතු විධිමත් කිරීම" යන මැයෙන් වූ අංක 11/0737/533/015 හා 2011.05.04 දිනැති අමාත්‍ය මණ්ඩල ප්‍රතිපත්තිමය තීරණය ක්‍රියාවට නැංවීමක් ලෙස "උතුරු හා නැගෙනහිර පළාත්වල පශ්චාත් යුද ගැටුම් සමයේ රජයේ ඉඩම්වලට අදාළ ගැටලු විසඳීමේ කඩිනම් වැඩසටහන" යන මැයෙන් ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් අංක 2013/01 හා 2013.01.31 දිනැති චක්‍රලේඛය නිකුත් කරන ලද බව දන්නේද;

(ii) එම චක්‍රලේඛයේ 2.2.2.1, 2.2.3.4, 2.2.3.5 හා 3.5 යන වගන්ති ප්‍රකාරව වවුනියා දිස්ත්‍රික්කයේ එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් කවරේද;

(iii) එම වැඩසටහන්වලදී ලබා දෙන ලද විසඳුම් කවරේද;

(iv) ගැටලු සඳහා විසඳුම් ලබා දෙන ලද එක් එක් පුද්ගලයාගේ නම සහ ලිපිනය එක් එක් ග්‍රාම නිලධාරි වසම අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

13.

2115/2021

ගරු රවුෆ් හකීම් මහතා,— ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) "උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම් සභා වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සහ උතුර හා නැගෙනහිර පළාත්වල ඉඩම් කළමනාකරණ කටයුතු විධිමත් කිරීම" යන මැයෙන් වූ අංක 11/0737/533/015 හා 2011.05.04 දිනැති අමාත්‍ය මණ්ඩල ප්‍රතිපත්තිමය තීරණය ක්‍රියාවට නැංවීමක් ලෙස "උතුරු හා නැගෙනහිර පළාත්වල පශ්චාත් යුද ගැටුම් සමයේ රජයේ ඉඩම්වලට අදාළ ගැටලු විසඳීමේ කඩිනම් වැඩසටහන" යන මැයෙන් ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් අංක 2013/01 හා 2013.01.31 දිනැති චක්‍රලේඛය නිකුත් කරන ලද බව දන්නේද;

(ii) එම චක්‍රලේඛයේ 2.2.2.1, 2.2.3.4, 2.2.3.5 හා 3.5 යන වගන්ති ප්‍රකාරව මුලතිව් දිස්ත්‍රික්කයේ එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් කවරේද;

(iii) එම වැඩසටහන්වලදී ලබා දෙන ලද විසඳුම් කවරේද;

(iv) ගැටලු සඳහා විසඳුම් ලබා දෙන ලද එක් එක් පුද්ගලයාගේ නම සහ ලිපිනය එක් එක් ග්‍රාම නිලධාරි වසම අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

14.

2116/2021

ගරු රවුෆ් හකීම් මහතා,— ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) "උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම් සභා වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සහ උතුර හා නැගෙනහිර පළාත්වල ඉඩම් කළමනාකරණ කටයුතු විධිමත් කිරීම" යන මැයෙන් වූ අංක 11/0737/533/015 හා 2011.05.04 දිනැති අමාත්‍ය මණ්ඩල ප්‍රතිපත්තිමය තීරණය ක්‍රියාවට නැංවීමක් ලෙස "උතුරු හා නැගෙනහිර පළාත්වල පශ්චාත් යුද ගැටුම් සමයේ රජයේ ඉඩම්වලට අදාළ ගැටලු විසඳීමේ කඩිනම් වැඩසටහන" යන මැයෙන් ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් අංක 2013/01 හා 2013.01.31 දිනැති චක්‍රලේඛය නිකුත් කරන ලද බව දන්නේද;

(ii) එම චක්‍රලේඛයේ 2.2.2.1, 2.2.3.4, 2.2.3.5 හා 3.5 යන වගන්ති ප්‍රකාරව යාපනය දිස්ත්‍රික්කයේ එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් කවරේද;

(iii) එම වැඩසටහන්වලදී ලබා දෙන ලද විසඳුම් කවරේද;

(iv) ගැටලු සඳහා විසඳුම් ලබා දෙන ලද එක් එක් පුද්ගලයාගේ නම සහ ලිපිනය එක් එක් ග්‍රාම නිලධාරි වසම අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?